මෙතෙක් කතාව

මතකයට පමණක් හිමිකම් කිව්යහැකි වන නමුත් සුන්දරවූ ආදරයක නටබුන් සමග පර්ත් වලින් සමුගන්නා ලහිරු අධිෂ්ඨාන පූර්වකව ජීවිතයට මුහුණදීමට උත්සාහ දරයි. සාමාන්‍ය සිදුවීම් අතරතුර මතකයේ හෙලිදරව්වකට කිසිදු පෙළඹවීමක් නොලබා වසරක පමණ කාලයක් පසුකරන ඔහු බලාපොරොත්තු නොවන ලෙස ටාන්‍යාගෙන් ලැබෙන දුරකථන ඇමතීමක් නිසා සසලවේ.



# හිම බිමේ සුදු රෝස

8

පර්ත් හි
විද්‍යානි මනතුංග ලියන
නව කතාව

-ලහිරු..."
-මේ ටාන්‍යා ද?"
-ඔව්.. ලහිරු...... මේ මම තමයි..." නැවත අප අතර නිහැඬියාවකි.
-ලහිරු ඇයි ඔයා කතා නැත්තෙ."

-නෑ... ටාන්‍යා.... ඔයා කොහෙ ඉඳල ද ඔය කතා කරන්නෙ?"
-මම දැන් ඉන්නෙ ලංකාවෙ..."

-ලංකාවෙ..." මම පුදුමයට පත්වුණෙමි. මහේල ඈ විවාහකරගෙන ද...? ඔහු සිතා සිටි පරිදි උපාධියේ වැඩ අවසන් කරගන්නට ඇත. නොඑසේ නම් මේ පැමිණ ඇත්තේ ඔවුන්ගේ අනාතගය සැලසුම් කරගැනීමේ අරමුණින් ද...?

-ලහිරු.... ඔයා දැන් දවල්ට කාල ද ඉන්නෙ?" මා තුළ තිබූ බඩගින්න කොහි ගියා ද දැන් නැත. එහෙත් වැඩිදුර නොසිතාම මම ඈට පිළිතුරු දුනිමි.

-නෑ තාම නැහැ. තව ටිකකින් කෑම ගන්නව."

-එහෙනම් එන්න මාත් එක්ක කෑම ගන්න." ඇය කියන්නේ සන්සුන්වය. මට මේ කිසිවක් හරිහැටි වටහාගත නොහැක.

-ඔයත් එක්ක කෑම කන්න... කොහේටද?" ඔයා කෙහෙ ඉඳල ද කතාකරන්නෙ ඔය...?
ඇය සිනාසෙන්නට විය.

-පුදුම වෙන්න එපා ලහිරු. මම ඉන්නෙ නුවර දැන්..... මම ඔයාගෙ අම්මගෙන් තමයි මේ දුරකථන අංකය ඉල්ල ගත්තෙ..... ඔයා එනවද?"

-නුවර, කෙහේ ද ඔයා ඉන්නෙ...? කෝ මහේල?" මා අසීමට සිතා නොසිටිය ද මහේලගේ නම මටවත් නොදැනිම මා මුවින් පිටවිය.

-මම නැවතිලා ඉන්නෙ කුවීන්ස් හෝටලයෙ. ඔයා එන්න ඒකෙ ඩයිනින් හෝල් එකට. මම එතන මේසයක් ළඟ ඉන්නව. මහේලත් ඔයාට හම්බවෙයි කෑම වෙලාවෙදි..."

-හොඳයි. මම එන්නම්."

-හම්බවෙමු එහෙනම්..."

-හම්බවෙමු ටාන්‍යා."

මා වැඩිදුර සිතන්න ගියේ නැත. එසේ සිතමින් සිට මේ අවස්ථාව මඟහැර ගැනීමට මට නුපුළුවන. මම එවලේ ම පිටත් වුණෙමි. නමුත් ඉදිරියට තබන හැම පියවරක් ම හදවත විසින් ආපස්සට ඉල්ලා සිටින බවක් වැඩිවේලාවක් නොයාම මට හැඟී යන්නට විය. මම මේ කරන්න යන දෙයින් සිදුවන්නේ කුමන හොඳක් දැයි මගේ බුද්ධිය මා වෙත ප්‍රශ්න කරමින් තිබිණි. නමුත් ඊට විරුද්ධව මගේ හදවත ඈ දැක ගැනීමේ ආශාවකින් පිබිද තිබිණි. මේ බලාපොරොත්තු නොවන හදිසි කැළඹිල්ල දරා සිටීමට තරම් ශක්තියක් මා තුළ ඇත්දැයි සැකසහිත නමුත් අනිකුත් සියලු ම කරුණු අභිබවා ඇයව දැකිය යුතුම යැයි වන සිතිවිල්ල මගේ ආත්මය අබියස අමුතු පණක් ලබා ඇත යැයි මට හැඟී ගියේය.

මට ගතවූයේ විනාඩි දහයකටත් වඩා අඩු කාලයකි. මම යන විට මහේලත් ටාන්‍යාත් දෙදෙනාම මේසයක් අසල විය. එය එසේ වේ යැයි මම සිතා සිටියෙමි. ඒ දසුන මා අපහසුවට පත් කළ ද කාලාන්තරයක් දරාගෙන සිටින වේදනාවකට ස්නායු පද්ධතිය ක්‍රමයෙන් හුරුපුරුදු වී ඇතුවා සේ මගේ හදවත දරුණු පෑරීමකට ඉන් ලක්වූයේ නැත.

මා දුටු ගමන් මහේල ඉදිරියට විත් සතුටින් මා පිළිගත්තේය. අපි බොහෝ දෑ පිළිබඳ කෑම ගන්නා අතරතුර කතාබහ කෙරුවෙමු. මහේල අධ්‍යාපන කටයුතු අවසන් කරගෙන සිටියේය. නමුත් මේ පැමිණ ඇති ගමනේ අරමුණ ගැන ඔහු කිසිවක් නොකීවේය. මා ඔවුන්ගෙන් ඒ පිළිබඳ ප්‍රශ්න කරන්නට ගියේ ද නැත.



-ලහිරු, ඔයා අද වැඩ ඉවරවෙන්නෙ කීයට ද?" ඒ ප්‍රශ්න කරන ලද්දේ ටාන්‍යා ය.
-විශේෂ වෙලාවක් නැහැ. ඇයි?"

-වැඩ ඉවරවෙලා හවසට බැරි ද මාව ටිකක් ඇවිදින්න එක්කගෙන යන්න ලහිරුට."

-ඇයි.. මහේල?" එය මට අයිති වැඩක් නොවේ යැයි සිත කියයි.

-මචං, උඹට පුළුවන් නම් ටාන්‍යාව ටිකක් ඇවිදින්න එක්කගෙන පලයං. මට ඇත්තට ම, වෙලාවක් නැහැ.... වැඩ ගොඩක් තියෙනව කරගන්න." කුමක් කියනවා දැයි මට සිතාගත නොහැක. මහේල දිගටම කතාකරයි.

-උඹට පුළුවන් නම් ලොකු උදව්වක්. මට බැරි වුණා මාලිගාවටවත් තවම ටාන්‍යාව එක්කගෙන යන්න..."
මහේල මේ කියන්නේ අත්තටම ද? මට පුදුමත් සිතේ.

-හොඳයි මම හවසට එන්නම්. ටාන්‍යා ලෑස්ති වෙලා ඉන්න... හතරයි තිහ වෙනකොට මම එන්නම්..."

මම ඉක්මනින් ඔවුන්ගෙන් සමුගෙන ගියෙමි. මහේල හවසට කරන්න ඉන්නේ කුමක් දැයි මා ඇසීමට ගියේ නැත. මහේලගේ ගෙදර ද නුවර කිට්ටුවය. ටාන්‍යාව ඔහු පවුලේ අයට හඳුන්වා දුන්නේ දැයි මම නොදනිමි. කෙසේ වුව ද මගේ තරමට පිටස්තරව ඇති වෙනත් කිසිවක්ම පිළිබඳව මා ඔවුන්ගෙන් ඇසීමට නොයමියි තීරණය කරගතිමි. නමුත් නැවත වරක් ඇය දකින්නට යන්නේය යන හැඟීම මා සතුටට පත්කර තිබිණි.

මම ඉක්මනින් ඔවුන්ගෙන් සමුගෙන
ගියෙමි. මහේල හවසට කරන්න ඉන්නේ
කුමක් දැයි මා ඇසීමට ගියේ නැත.

හවස මම ටාන්‍යාව දාළදා මාළිගාව වෙත මුලින්මත් ඊළඟට වැව රවුමේ ඇවිදීමටත් කැටුව ගියෙමි. ඇය බොහෝ දෑ සතුටින් සැහැල්ලුවෙන් යුක්තව මා සමඟ කතාබහ කළාය. මාද පෙරලා ඈට පිළිතුරු දුන්නේ වෙනදාට වඩා සැලකිල්ලෙනි. ඇයද 'ලහිරු ඉස්සරට වඩා දැන් වෙනස්' යැයි කියන්නට ගියේ නැත. ඇගේ උවමනාවට අනුව අපි වැව අසල ගසක් යට තිබූ ගල් බංකුවක් මත මොහොතකට වාඩි වීමු. ඇය මොහොතක් සිතිවිල්ලේ යෙදී ඉන්පසු කටහඬ අවදි කළාය. මා සිටියේ බොහ් ප්‍රීතිමත් වූ හැඟීමකින් යුතුවය.

-ලහිරු, අර වේගයෙන් හැරී හැරී එහා මෙහා පීනන මාළුවෝ මොනව හිතනව ඇති කියල ද ඔයා හිතන්නෙ...?"

-මට කන්න මොනවද තියෙන්නෙ කියල හිතනව ඇති." මම කිසිවක් නොසිතාම කීවේ සිනාසෙමිනි.

-නෑ.. ඒක නෙමෙයි ඒ මාළු හිතනව ඇත්තෙ..."
-එහෙම නම් මොකද්ද..?"

-කොහේද, මම ආදරය කරපු කෙනා කියලයි හිතනව ඇත්තෙ..."

මගේ සිනහව අතුරුදහන් විය. ටාන්‍යා සිටිනවා ඇත්තේ සතුටින් නොවේ ද....? ඈ ඒ කියූ කතාවේ තේරුම කුමක් ද....? මොහොතක් නිහඬව සිටි ටාන්‍යා ඉන්පසු නැගී සිටියාය. මම ද ඈ අනුව ඉදිරියට පා තැබුවෙමි. නැවත කතාව ඇරඹුවේ ද ඈම ය.

-ලහිරු..."
-හ්ම්..."

-අපේ අම්ම පුංචි කාලෙ එයා හැදිල තිබුණෙ රට ඇතුළට වෙන්න තිබුණ නගරයකයි."

-ඇත්තද? එතකොට විවාහයෙන් පස්සෙ ද අම්ම මුහුදට කිට්ටුව තැනක පදිංචියට ඇවිත් තියෙන්නෙ?"

-නෑ. ඊට කලින්.... අම්මල විවාහවෙන්න කලින්... මගෙ ආච්චිලයි මුලින්ම ඇවිත් තියෙන්නෙ. ආච්චිගෙ ගේ තියෙන්නෙත් අපේ ගෙදරට කිට්ටුවකයි... මට මතකයි අම්ම පුංචි කාලෙ ගැන කියන කතා."

-මොනවද ඒ?"

-අම්මල පොඩි කාලෙ හැදිල තියෙන්නෙ විලිටන් කියන ප්‍රදේශයේ... අපේ විශ්වවිද්‍යාලයට කිට්ටුව..."

-මම දන්නව... හරි ගණන් පැත්තක්...."

-ඔව්.. ඒ ගණන් ගිය කාලෙ තමයි අම්මල ඉඩම් විකුණල හිලරි වලින් ඉඩම් අරන් තියෙන්නෙ. අම්මලගෙ ගේ ළඟ ම පදිංචි වෙලා ඉඳල තියෙන්නෙ ඇබෝර්ජිනල් පවුලක්... මිනිස්සු ඕස්ට්‍රේලියාවට විශාල වශයෙන් සංක්‍රමණය වෙන්න පටන්ගන්නත් කලින් ඉඳලයි අම්මල කළු සුදු භේදයකින් තොරව හිතන්න පටන් අරන් තියෙන්නෙ." මම නිහඬවම ඈට ඇහුම්කන් දුනිමි.

-අපේ අම්ම, ආච්චි, සීය හරි ම ආදරේකින් ඒ ඇබෝර්ජිනල් පවුල ගැන හිතන්නෙ... ඉඩම් විකුණලා ලොකු ආදායමක් ගන්න පුළුවන් වුණු හින්ද, අම්මලටත් කලිනුයි ඒ පවුල් විලිටන්වලින් ගිහිල්ල තියෙන්නෙ."

-ඔයාගෙ ආච්චිලත් එහෙන් ඇවිත් තියෙන්නෙ ඒ නිසා ද?"

-ඒකත් එකක්.. තාත්තගෙ අදහසුත් බලපාන්න ඇති... අපේ අම්ම පවුලෙ වැඩිමලා.. අම්මගෙන් ඈත් වෙන්නත් අකමැති නිසා තමයි පදිංචිය දැන් ඉන්න පළාතට වෙනස් වෙලා තියෙන්නෙ.... මගේ අදහස්වලටත් අපේ පවුලෙ සිතුම් පැතුම් බලපානවා.. ලහිරු... ඔයාට තේරෙනවද?"

-මට හොඳට තේරෙනව ටාන්‍යා..." කවදාකවත් ඇති වී නොතිබුණු ලෙන්ගතුකමක් ඈ වෙනුවෙන් මා හදවතේ මතුවී ඇත. එහෙත් මහේල මේ හදවත ඒ හැටියෙන් ම තේරුම් ගන්නවා ඇත්ද? වැඩිදුර නොසිතාම මම සිතේ මතුව ආ හැඟීම් පිටකළෙමි.
-ටාන්‍යා..."

-ඇයි ලහිරු..."
-ටාන්‍යා...මට හිතෙනව.... ඔයා හරියට සුදු රෝස මලක් වගේ කියල..."

-ඇයි එහෙම කිව්වෙ ලහිරු....?"

-රතු රෝසමලක තියෙනව වගේ

32 පිටට